# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2325/05 - 2023 මාර්තු මස 27 වැනි සඳුදා - 2023.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(3) වන වගන්තිය සමඟ කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියමය

2020 ජනවාරි මස 08 වන දින සංශෝධිත ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාවේ 3 වන ඡේදය හා 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(3) වන වගන්තිය සමඟ කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා තාක්ෂණික උපදේශන කමිටුවක් පත් කරමි. එම කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. සනත් ජයසූරිය මහතා - (කමිටු සභාපති)
II. ෆාවීස් මහරූෆ් මහතා - (කමිටු සාමාජික)
III. කපිල විජේගුණවර්ධන මහතා - (කමිටු සාමාජික)
IV. චරිත් සේනානායක මහතා - (කමිටු සාමාජික)
V. අසන්ත ඩී මෙල් මහතා - (කමිටු සාමාජික)

ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා අපක්ෂපාතීත්වය ගැන මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත විධිවිධාන ප්‍රකාරව පිහිටුවන ලබන අතර ඒ සඳහා අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

**රොෂාන් රණසිංහ** (පා.ම),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG - 03 - 0344

1A - G 39195— 07 (2023/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*